## ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ** 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.306,441 ක් වූ කාර්යාල උපකරණ සහ රු. 133,900 ක් වූ පරිගණක උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට සහ දෛනික මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ගණකාධිකාරී උපදෙස් මෙන්ම අභ්‍යන්තර විගණන පරීක්ෂකයෙකුගේ සහාය ලබාදෙන ලෙස රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇතත් ඒ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ස්ථාවර වත්කම් අගය කිරීම හා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 47(අ) උප ඡේදය ප්‍රකාරව භාවිතා කල පිරිවැය සූත්‍රයද ඇතුළුව තොග මැනීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඇතුලත් වටිනාකම රු.398,511 ක් වූ ප්‍රකාශන තොග සම්බන්ධයෙන් යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි | -එම- | තොග අගය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට පශ්චාත් සේවක ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් කර තිබුණද, වර්ෂයට අදාළ වෙන්කිරීම් ප්‍රමාණය ගණනය කිරීම සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 හි 15 ඡේදය පරිදි ප්‍රමිති නිර්මාණය කරන ආයතනවල මෑත කාලීන ප්‍රකාශ කිරීම් පදනම් කරගෙන ප්‍රතිපත්තියක් සකස් කරගෙන නොතිබුණි. එවැනි ප්‍රතිපත්තියක් නොමැතිව සේවකයින් ලබාගත් වැටුප හා සේවා කාලය පමණක් පදනම් කරගෙන සේවකයින් 05 දෙනෙකු සඳහා 2017 සහ 2018 වර්ෂ සඳහා පිලිවෙලින් රු.632,000 සහ රු.716,851 ක පාරිතෝශික වෙන්කිරීම් සිදුකර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට සහ දෛනික මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය ගණකාධිකාරී උපදෙස් මෙන්ම අභ්‍යන්තර විගණන පරීක්ෂකයෙකුගේ සහාය ලබාදෙන ලෙස රේඛීය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇතත් ඒ සඳහා මෙතෙක් පිළිතුරු ලැබී නැත. | සේවක ප්‍රතිලාභ වෙන්කිරීම සඳහා රජයේ නීතිමය රාමුවට අනුකූල වන පරිදි ප්‍රතිපත්තියක් සකස් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1952 අංක 18 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල පනත (i)10(1) උපවගන්තිය | | | |
| | සෑම තුන්මාසයකට වරක් මණ්ඩලයේ රැස්වීමක් පැවැත්විය යුතු වුවත් 2018 වර්ෂය වෙනුවෙන් එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. . | 2018 වසරේ වරින් වර සිදු වූ දේශපාලනික වෙනස්වීම් හේතුවෙන් ශ්‍රී ලංකා කලා මණ්ඩල විධායක සභාවේ සහ රාජ්‍ය උපදේශක සහ සාමාජික පත්වීම් අවස්ථා | ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතෙහි විධිවිධානයන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගණනාවකදී වෙනස්වීම් වලට ලක්විය. මේ හේතුවෙන් කලා මණ්ඩල රැස්වීම් විධිමත් ලෙස පැවැත්වීමට නොහැකි වී ඇත. | |
| (ii) | 11(1) උපවගන්තිය | මණ්ඩලයේ විධායක කමිටුව පත්කිරීම, 07 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් පත්කරන ලද මණ්ඩලයෙහි සාමාජිකයින් විසින් සිදුකල යුතු වුවත් එවැනි විධිමත් පත්කිරීමකින් තොරව ක්‍රියාත්මක වූ විධායක කමිටුවක් මගින් 2018 වර්ෂයේ සියලු වියදම් අනුමත කිරීම් සහ අනෙකුත් කලමනාකරණ තීරණ ගැනීම සිදුකර තිබුණි. | පනතේ 07 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ විධායක කමිටුව අමාත්‍යවරයා විසින් පත්කර ඇත. | -එම-. |
| (iii) | 12(1) උපවගන්තිය | උපදේශක සහා පත්කිරීම පනතේ 7 (අ) වගන්තිය අනුව අමාත්‍යවරයා විසින් පත්කල මණ්ඩලයේ සාමාජිකයින් 5 දෙනා විසින් කළ යුතු වුවත් 2018 ජූනි 14 දින සිට වර්ෂ 3 ක කාලයක් සඳහා කලා මණ්ඩල සභාපතිවරයා විසින් උපදේශක සභා සාමාජිකයින් පත්කර තිබුණි. | උපදේශක සභා වල සභාපතිවරුන් සහ සාමාජිකයින් පත්කිරීමට රේඛීය අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කළ ද මෙතෙක් විධායක කමිටුවට පත්කර ඇත්තේ සභාපති ඇතුළු සාමාජිකයන් දෙදෙනෙකු පමණි. | -එම- |
| (iv) | 13(2) වගන්තිය | මණ්ඩලයේ නිලධාරීන්/ සේවකයින් 05 දෙනෙකු පත්කිරීමේදී පත්කිරීමේ බලධාරියා මණ්ඩලයේ විධායක සභාව වුවද පත්කිරීම හා සේවයේ ස්ථිර කිරීම මණ්ඩලයේ සභාපතිවරයා විසින් කර තිබුණි. | අදාළ නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගනු ලැබේ | -එම- |
| (v) | 23 වැනි වගන්තිය | මණ්ඩලය විසින් සම්පාදනය කල නීති, රීති අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබිය යුතු වුවත් මණ්ඩලයෙහි බඳවා ගැනීමේ පරිපාටිය ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | මේ සම්බන්ධව යම් නිවැරදි කිරීමක් වර්තමානයේදී සිදු කිරීමට ඇත්දැයි අවධානය යොමු කර අදාළ නිවැරදි කිරීම් සිදුකිරීමට පියවර ගනු ලැබේ | -එම- |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11: 10: 2 වගන්තිය | විධිවිධානවලට පටහැනිව මණ්ඩලයෙහි නිලධාරීන්/ සේවකයින් 05 දෙනෙකු පත්වීම් ස්ථිර කළ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙහි ස්ථිර කර තිබුණි. | අදාළ නිවැරදි කිරීම් මේ වන විට සිදු කර ඇත | ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළයුතු වීම. |
| (ඇ ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 264 (1) | අවස්ථා 05 කට අදාළ රු. 3,492,495 ක් වටිනා ගෙවීම් සම්බන්ධයෙන් ආදායකයාගෙන් කුවිතාන්සියක් ලබාගෙන නොතිබුණි. | මෙවැනි මගහැරීම් අවම කර ගැනීමට කටයුතු කරනු ඇත. | මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කළයුතු වීම. |
| (ii) මුදල් රෙගුලාසි 381 (1) | මණ්ඩලය ආරම්භයේ සිට පැවත එන බැංකු ජංගම ගිණුමක් ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර නොතිබුණි. | ගිණුම ආරම්භ කිරීමේ දී අතපසුවීමක් සිදුවී ඇතත්, ඉදිරියේ දී භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට අවශ්‍ය පියවර ගනු ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,285,461 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.531,989 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,817,450 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන ලැබීම් රු. 1,000,000 ක් වැඩිවීම සහ ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන ලැබීම් රු. 2,020,000 ක් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම් සියයට 38.7 කින් වැඩිවීම, ප්‍රකාශන අලෙවි ආදායම සියයට 95.2 කින් අඩුවීම සහ ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන ලැබීම් සියයට 100 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 1.1:1 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 4.4:1 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ ජංගම වත්කම් අනුපාතයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 3.3.1 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ බැංකු ශේෂය සියයට 466.11 කින් වැඩිවීම සහ ජංගම වගකීම් සියයට 10.15 කින් අඩු වීම මෙම වැඩිවීමට හේතුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ක්ෂණික වත්කම් අනුපාතයද සැළකිය යුතු ලෙස වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් සියයට 245.1 කින් වැඩිකීම ජංගම වගකීම් සියයට 10.15 කින් අඩු වීම එම අනුපාතය වැඩිවීමට හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වියදම් ඇස්තමේන්තුවක් සකස් කිරීමකින් තොරව වැඩසටහන් 04 ක් සඳහා එකතුව රු. 180,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. | ඉදිරියේ දී ගනු ලබන සියලුම අත්තිකාරම් සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගනු ලැබේ. | වියදම් ඇස්තමේන්තුවක් මත වැඩසටහන් සඳහා අත්තිකාරම් ලබා දීමට කටයුතු කළ යුතු වීම. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 අගෝස්තු 26 දිනැති අංක DMS/E3/53/4/311/1 දරන ලිපිය මඟින් අනුමැතිය ලබා දී තිබුණ ද ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ස්ථිර පත්කිරීම සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් සිදුකර නොතිබූ අතර ඒ සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සංස්කෘතික නිලධාරියෙකු වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි | ශ්‍රී ලංකා කලා මණ්ඩලය සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව කටයුතු කරන බැවින් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වැඩ බැලීමේ පදනම මත පත්කර ඇත. | මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලේකම් තනතුර සඳහා ස්ථිර පත්කිරීමක් කිරීමට කටයුතු කල යුතුවීම. |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරක් නොවන ගිණුම් ලිපිකරු තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන 2018 ජනවාරි සිට දෙසැම්බර් දක්වා රු. 360,000 ක දීමනා ගෙවා තිබුණි. | සේවයේ අත්‍යාවශ්‍යතාවය මත විධායක සභාවේ අනුමැතියට යටත්ව මෙම සේවය තවදුරටත් ලබා ගැනීමට පියවර ගෙන ඇත. | මණ්ඩලයේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කල යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන මාස 4 දින 09 ක ප්‍රමාදයකින් පසුව 2019 ජූලි 10 දින ඉදිරිපත් කර තිබුණි. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වීම. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුලත් නොවූ සොකරි ශාන්තිකර්මය සංරක්ෂණය වැඩසටහන සහ ද්විභාෂා ජාතික සම්මන්ත්‍රණ 03ක් පැවැත්වීම සඳහා රු. මිලියන 2.45 ක් වැයකර තිබුණි. | මණ්ඩලයේ විධායක සභාවේ අනුමැතිය මත සොකරි ශාන්තිකර්මය සංරක්ෂණය වැඩසටහන සහ කලා භූෂණ සම්මාන උළෙල සඳහා අනුග්‍රාහකත්වය ලබාදී ඇත. | අනුමත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කල යුතු වීම. |
| (ආ) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 10.4 ක් වූ වැඩසටහන් 06ක් සම්පූර්ණයෙන් ඉටුකර නොතිබුණි. | වර්ෂය අවසාන වනතෙක්ම ප්‍රතිපාදන අප වෙත ලබා නොදීම හේතුවෙන් සැලසුම් කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | -එම- |

## 4.3 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 133 හා 134 විධිවිධාන අනුව මණ්ඩලයේ අභන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ රේඛීය අමාත්‍යාංශය විසින්ද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩල අප ආයතනයේ නොමැති බැවින් රේඛීය අමාත්‍යාංශය හරහා අභ්‍යන්තර විගණනයක් සිදුකර දෙන ලෙස ඉල්ලා අමාත්‍යාංශ ලේකම් වෙත ලිපි ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කල යුතුවීම. |

## 4.4 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව සෑම කාර්තුවකටම වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | කාර්තුවකට වරක් රේඛීය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කල යුතුවීම. |